රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 30/2019

මගේ අංකය: EST-3/DICIP/06/0259
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2019.09.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2, 21:2, 22:1:1 හා 14:12 උප වගන්ති සංශෝධනය කිරීම**

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2, 21:2, 22:1:1 හා 14:12 උප වගන්ති කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එම උප වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2019.08.27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

**I. ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2 උප වගන්තිය සංශෝධනය කිරීම**

13:2 කිසියම් විෂමාචාරයක් සම්බන්ධ සිදුවීමක් පිළිබඳව මූලික විමර්ශනයක් පැවැත්වීම මාස දෙකක් ඇතුළත අවසන් කළ යුතු බව නියෝගය නිකුත් කරන අවස්ථාවේ දීම මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා නියෝග කරන බලධරයකු විසින් මූලික විමර්ශන නිලධරයා හෝ නිලධර කමිටුව වෙත අනිවාර්යයෙන් ම නියම කළ යුතු ය. එසේ වුව ද, ඊට අමතර කාලයක් අවශ්‍ය වන්නේ නම් මූලික විමර්ශන නිලධරයා හෝ නිලධර කමිටුව විසින් ප්‍රමාණවත් පිළිගත හැකි හේතු ඉදිරිපත් කරමින් අදාළ බලධරයාගෙන් අනුමතියක් ලබාගත යුතු ය. එතෙකුදු වුවත් සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීමට අදාළ සෑම පාර්ශවයක්ම නිරන්තරයෙන්ම වග බලා ගතයුතු වන්නේ ය.

**II. ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21:2 උප වගන්තිය සංශෝධනය කිරීම**

21:2 චූදිත පක්ෂය, පිළිගත හැකි හේතූන් පිළිබඳව පූර්ව දැනුම්දීමකින් තොරව විධිමත් විනය පරීක්ෂණයේ ආසන්න පරීක්ෂණ සැසිවාර දෙකක දී නොපැමිණියේ නම් චූදිත නිලධාරී නොමැති සේ සලකා විනිශ්චය සභාව විසින් පරීක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය. ඒ අනුව විනය පරීක්ෂණය ඒක පාර්ශවිකව පැවැත්වීමට කටයුතු කරන බව විනිශ්චය සභාව විසින් චූදිත නිලධරයා වෙත ලේඛනගත තැපැලෙන් දන්වා යැවිය යුත්තේ ය. විනය පරීක්ෂණය පැවැත්වීමට නියම කරනු ලබන ඊළඟ දිනයේ දී චූදිත පක්ෂය ඊට සහභාගීවීමට අපොහොසත් වුවහොත් එදින සිට ඉදිරි පරීක්ෂණ දිනයන්හි චූදිත පක්ෂය ඒ සඳහා සහභාගී වූව ද නොවූව ද විනය පරීක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යාමට විනිශ්චය සභාව කටයුතු කළයුතු වන්නේ ය.

## III. ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 22:1:1 උප වගන්තිය සංශෝධනය කිරීම

22:1:1 යම් නිලධරයෙකු විසින් සිදු කරන ලද විෂමාචාරයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද චෝදනා පත්‍රයකට අදාළව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය එම පරීක්ෂණය ආරම්භ කර මාස හයක් ඇතුළත නිම කළ යුතු ය. ඒ සඳහා අමතර කාලයක් අවශ්‍ය වන්නේ නම් පරීක්ෂණ නිලධාරී විසින් ප්‍රමාණවත් පිළිගත හැකි හේතු ඉදිරිපත් කරමින් විනය බලධරයාගේ අනුමතිය ලබාගත යුතු ය. 31:11 උප වගන්තියෙහි සඳහන් චෝදනාවක් නොවන අවස්ථාවක චූදිත නිලධරයාගේ ප්‍රමාදයක් නිසා පරීක්ෂණය ප්‍රමාද වන අවස්ථාවක දී හැර වෙනත් කරුණක් නිසා එසේ මාස හයකට වඩා ප්‍රමාද වන්නේ නම් චූදිත නිලධරයා වැඩ තහනමට ලක් කර ඇත්නම් විනය පරීක්ෂණයේ සඳහන් කරුණුවලට යටත්ව විනය බලධරයාගේ අභිමතය පරිදි චූදිත නිලධරයා නැවත සේවයේ පිහිටුවා වැටුප් ගෙවිය හැකි ය. එතෙක් නොගෙවන ලද වැටුප පිළිබඳව විනය නියෝගය ලැබීමෙන් පසු එහි සඳහන් පරිදි කටයුතු කළ යුතු ය.

## IV. ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 14:12 උප වගන්තිය සංශෝධනය කිරීම

14:12:1 එසේ වුව ද, යම් රජයේ නිලධරයෙකු යම් තනතුරකට අදාළ උසස් කිරීමේ විභාගයකට හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයකට හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකට පෙනී සිටීමට අවශ්‍ය සියලුම පූර්ව සුදුසුකම් සපුරා තිබිය දී වැඩ තහනම් කිරීම යන්න පමණක් ම පාදක කොට ගෙන අදාළ උසස් කිරීමේ විභාගයට හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයට හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකට පෙනී සිටීමට නුසුදුස්සෙකු නොවන්නේ ය.


ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය